# සයිබර් අවකාශය තුළ මුහුණු පොත ආශ්‍රිත කාන්තා ප්‍රචණ්ඩත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*ඩබ්.එම්.සී.එස්. පතිරණගේ [1]*

සරල සන්නිවේදන මාධ්‍යයන් වඩාත් සංකීර්ණ සහ කාර්යක්ෂම සන්නිවේදන මාධ්‍යයන් බවට පරිවර්තනය වීමත් සමඟ නිර්මාණය වූ සන්නිවේදන මාධ්‍යයන් අතර මුහුණු පොතට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. අතීත සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් මිදී සමාජ සම්බන්ධතා ඇඟිලි තුඩකට සීමා වූ කාල වකවානුව ආරම්භ වීමත් සමඟ එමඟින් කාන්තාවට සිදු වූ සහ මේ වන විටත් සිදුවෙමින් පවතින අපරාධයන්, ප්‍රචණ්ඩත්වයන් ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගෙන ඇත. මුහුණු පොත මඟින් කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වයක් ඇතිවන්නේ ද යන්න සමාජය තුළ පැනනැගී ඇති ගැටලුකාරී තත්ත්වයක් බැවින් එය මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ලෙස පෙන්වාදිය හැකි අතර මුහුණුපොත මගින් සිදු වන නීතිවිරෝධී කාන්තා ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ කරගත් මෙම අධ්‍යයනයෙහි උපඅරමුණු බවට පත් වන්නේ මුහුණු පොත තුළ කාන්තාව ප්‍රචණ්ඩත්වයට ලක් වීමට බලපාන හේතු හඳුනාගැනීමත්, මුහුණුපොත ආශ්‍රිත ව සිදු වන කාන්තා ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා පවතින නීතිරීතිවල ප්‍රායෝගිකභාවය අධ්‍යයන කිරීමත් ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් සිදු කරන මෙම අධ්‍යයනය සඳහා අරමුණු සහගත නියැදිය ඔත්සේ තෝරාගත් ප්‍රතිචාරකයන් 100ක් ඇසුරින් දත්ත රැස් කිරීම සිදු විය. ප්‍රථමික දත්ත රැස් කිරීමේ දී ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යොදා ගැනීම සිදු වූ අතර ද්විතියක දත්ත යටතේ පොලිස් වාර්තා, යූ ටියුබ් වීඩියෝ, ප්‍රවෘත්ති ප්‍රකාශන ආදිය මඟින් මෙම අධ්‍යයනය පෝෂණය කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගෙන ඇත. මෙලෙස මුහුණු පොත ආශ්‍රිත ව සිදු වන කාන්තා ප්‍රචණ්ඩත්වයේ වර්තමාන තත්ත්වය පිළිබඳ විමසා බැලීමේ දී, ප්‍රශ්නාවලියට මුහුණ දුන් කාන්තාවන් 60 දෙනෙකුගෙන් බහුතරයක් කාන්තාවන් එනම්, 98.5 % ක ප්‍රමාණයක් මුහුණු පොත භාවිත කරන අතර ඉන් 11.9% ම මුහුණුපොත භාවිතය සඳහා ඉහළ රුචිකත්වයක් දක්වා ඇත. මුහුණුපොත ආශ්‍රිත ව ගැටලුවලට හෝ අපහසුතාවන්ට ලක් වූ පිරිස 61.2% බවට වාර්තා වී ඇත. එයින් අසභ්‍ය චායාරූප හා වීඩියෝපට යැවීමේ ස්වරූපයෙන් කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට ලක් වී ඇති ප්‍රමාණය වැඩි ප්‍රතිශතයක් ගන්නා අතර 38.2% ප්‍රතිශතාත්මක අගයක් ගන්නා බව පර්යේෂණය තුළින් අනාවරණය විය. පර්යේෂණයට යොදා ගත් නියැදියෙන් බහුතරයක් ම සමාජ මාධ්‍ය තුළින් වන ප්‍රචණ්ඩත්වයට එරෙහි ව පවතින නීති පිළිබඳ දැනුවත් බවක් ඇතත් ඔවුන් නීතිමය ක්‍රියාමාර්ගවලට යොමු නොවී ඇති බව අනාවරණය විය. මේ අනුව නූතන තාක්ෂණයේ දියුණුවත් සමඟ ශීඝ්‍ර සන්නිවේදන පරිවර්තනයක් සිදු වී ඇති මෙම කාල වකවානුවේ දී සමාජ මාධ්‍ය මඟින් කාන්තාවන් විවිධ ස්වරූපයෙන් ප්‍රචණ්ඩත්වයට ලක් වන බවත් ඊට එරෙහි ව කාන්තාවන් නීතිමය ක්‍රියාමාර්ගවලට යොමු වීමේ ප්‍රවණතාව විරල බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** නූතන තාක්ෂණය, සමාජ මාධ්‍ය, මුහුණු පොත, කාන්තා ප්‍රචණ්ඩත්වය, සමාජ සම්බධතා

[1] ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය. chathurajisrimali62@gmail.com